
උපදෙස් පත්‍රිකා අංක: 2016/09

# ළපටි බද්ධ පැළ නිපදවීම



ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

# ගුණාත්මක භාවයෙන් යුතු ළපටි බද්ධ පැළ නිපදවීම


## නොපමාව කල යුත්තක් !

රබර් පර්යේෂණායතනයෙන් අනුමත කරන ලද ක්ලෝන බොහොමයක නිෂ්පාදන ඵලදායීතාවය වසරකට හෙක්ටයාරයකට කි.ග්‍රෑම් 1500-3000 අතර පරාසයක පවතී. නමුත්, බොහෝ වතුවල අස්වැන්න මීට බෙහෙවින් පහළ අගයක පවතී. මේ සඳහා බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ, වගාවන් සඳහා ඉතා දුර්වල තත්වයේ පැළ භාවිත කිරීමයි. උසස් ගුණාංග සහිත පැළ භාවිතා කිරීමෙන් ක්ෂේත්‍රයේ නියමිත පැළ සංඛ්‍යාව පවත්වා ගැනීමටද, වැඩි අස්වැන්නක් ලබා ගැනීමටද හැකි වේ.

## උසස් තත්වයේ පැළයක් යනු කුමක්ද?

තෝරා ගන්නා ලද, ශක්තිමත් ග්‍රාහක පැළයකට, තත්වයෙන් උසස් අංකුරයක් බද්ධ කිරීමෙන් නිෂ්පාදනය කරගනු ලබන පැළය ගුණාත්මක පැළයකි. මෙලෙස ලබා ගන්නා පැළ ඉහළ වර්ධන වේගයකින් යුක්ත වන බැවින්, ඉක්මනින් කිරි කැපීම ඇරඹීමට හැකි වනු ඇත (වසර 5 ක් තුල). තවද, යොදා ගන්නා ලද ක්ලෝනයෙන් ලබාදිය හැකි උපරිම ඵලදාවද ලබා දෙනු ඇත.

ළපටි බද්ධ ක්‍රමයට නිපදවූ පැළයක්



කොළමාල 2 ක් වත් තිබිය යුතු අතර ඒ අතර පරතරය සෙ.මී. 30 ක් වත් විය යුතුයි

කඳේ විශ්කම්භය මි.මී. 5 ට නොඅඩු විය යුතුය.

## අවශ්‍යතා කවරේද?

උසස් තත්වයේ බද්ධ පැළ නිෂ්පාදනය කිරීමට නම්, ග්‍රාහක පැළ හා බද්ධ අතු යන දෙවර්ගයම උසස් තත්වයෙන් තිබීම අත්‍යවශ්‍ය වේ. උසස් තත්වයේ බීජ පැළයක් හෙවත් ග්‍රාහක පැළයක් ලබා ගැනීම ප්‍රධාන වශයෙන් අනුගමනය කරන ලද පැළ තෝරා ගැනීමේ ක්‍රියාවලිය මත රඳා පවතී. බද්ධ පොතු සඳහා නම්, බද්ධ අතු තවානේ වයස වසර 10කට වඩා අඩු විය යුතු අතර, හොඳින් පොහොර යොදන ලද, වාර්ෂිකව කප්පාදු කරන ලද එකක් විය යුතුය. තවද, තවානේ ක්ලෝන මිශ්‍ර නොවී වෙන් වෙන් වශයෙන් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ.

## මෙලෙස සිටුවීම සඳහා යොදා ගනු ලබන්නේ කුමන ප්‍රතිශතයක්ද?

වැලි තවානේ වපුරන ලද බීජ සියල්ලම ප්‍රරෝහණය වුවද, සිටුවීම සඳහා යොදා ගනු ලබන්නේ එයින් උපරිම වශයෙන් 50% ක් පමණි. මෙහිදී මුලින් ප්‍රරෝහණය වූ බීජ තෝරා ගත යුතුය. මේ අනුව වැපිරිය යුතු බීජ සංඛ්‍යාව, ග්‍රාහක පැළ අවශ්‍යතාවය මෙන් දෙගුණයක් බව සැලකිල්ලට ගත යුතුය.

## සාර්ථකත්වය උදෙසා ඉගියක්

තවාන තවදුරටත් පවත්වාගෙන යා යුතු වන්නේ මෙලෙස වැලි තවානේ මුලින් ප්‍රරෝහණය වන බීජ තෝරා ගැනීම සාර්ථකව සිදු කළ හැකි නම් පමණි. ශක්තිමත් ග්‍රාහක පැළයක් නිපදවීම සඳහා ඉතා වැදගත් වන මෙම තේරීම් ක්‍රමවේදය අනුගමනය කරන්නට අසමත් වීම, දුර්වල බද්ධ පැළ නිෂ්පාදනයට මග පාදයි. මෙලෙස මුල් පියවරේදී ශක්තිමත් පැළ තෝරා ගන්නට අසමත් වුව හොත්, එයින් ඇතිවන අවාසිය වෙනත් කිසිදු ශෂ්‍ය විද්‍යාත්මක කටයුත්තකින් පිරිමසාලිය නොහැක.

## බිම් තවාන් අත්හරිමු

ග්‍රාහක පැළ ලබා ගැනීම සඳහා තවදුරටත් බිම් තවාන් නිර්දේශ නොකරන අතර, එයට හේතුව වන්නේ එහිදී ලැබෙන පැළ වල ගුණාත්මක භාවය පිළිබඳව කිසිවෙකුට හෝ වගකීමක් ගත නොහැකි වීමත්, මෙම තවාන් මගින් බොහෝ විට දුර්වල පැළ නිපදවන බැවිනුත්ය.

## පොලිතීන් මලු තවාන

මාන 300 කළු පොලිතීන් වලින් සාදන ලද අගල් 6 x 15 මාන 500 යේ අගල් 7 x 18 පොලිතීන් මලු මේ සඳහා සුදුසු වේ. මේ සඳහා, මල්ලෙහි පහළ කොන් දෙකෙන් ඇතුලට රැල්ලක් මෙන් නවන ලද (guzatted) හා පතුලේ සිට 2/3 ක උසක් දක්වා සිදුරු විදින ලද මලු සාධාරණ මිළකට වෙළඳ පොළෙන් මිළදී ගත හැක.

## මලු පිරවීම සඳහා පස්

හැකි සෑම අවස්ථාවකදීම, මතුපිට ලෝම පස මේ සඳහා භාවිතා කළ යුතු අතර, මලු පිරවීමට පෙර, එක් බෑගයකට කාබනික (කොම්පෝස්ට්) පොහොර ග්‍රෑම් 50 ක් වන සේ පසට මිශ්‍ර කල යුතුය. සෑම පොලිතීන් මල්ලකටම ආනයනික (IRP) හෝ ඉහළ ශ්‍රේණියේ (HERP) රොක් පොස්පේට් ග්‍රෑම් 50 ක් මිශ්‍ර කිරීම අනිවාර්‍යය වේ. මේ සඳහා මලු පිරවීමට ගන්නා පස් ඝණ අඩි 100කට (10’x10’x1’) ආනයනික රොක් පොස්පේට් කි.ග්‍රෑ. 50 ක් කලවම් කර, මලු 1,000 ක් (6” x 15”) පිරවීමට යොදා ගත හැක.

## තවාන් සැලැස්ම

පස් පුරවන ලද පොලිතීන් මලු එකිනෙකට යාව නොගැඹුරු කාණු වල (4"- 6" ගැඹුරු) තනි පේලියට සකස් කලයුතු අතර, පේලි අතර පරතරය අඩි 1½ කි.

## ප්‍රරෝහණය වූ බීජ මලු තුල සිටුවීම

බීජ ප්‍රරෝහණය වීමත් සමගම ඒවා මලු තුල සිටුවිය යුතු අතර, එක් බෑගයක සිටුවිය යුත්තේ ප්‍රරෝහණය වූ එක් බීජයක් පමණි. වියළි කාලගුණික තත්ව යටතේදී, සිටුවන ලද බීජ පැළ කැකිල්ල වැනි ආවරණයක් මගින් සෙවන කල යුතු අතර, විකල්පයක් ලෙස පැළය සෙ.මි. 5-6 දික් වන තුරු සිටුවීම පමා කිරීමද කළ හැක. එහෙත් මෙම ක්‍රමය භාවිතා කරන්නේ නම්, ඉතා සුපරික්ෂාකාරීව පළමු දින 14 තුල ප්‍රරෝහණය වූ බීජ පමණක් භාවිතා කළ යුතුයි. ප්‍රරෝහණය වූ බීජ පොලිතින් මලුවල සිටුවා මාස 2 ක් ඇතුලත දුර්වල පැළ පොලිතීන් මලු සමගම එම පේලිවලින් ඉවත් කර, හිස් ස්ථානයන් එම පේලියේ අවසානයේ ඇති වැඩුන පැළ වලින් සම්පුර්ණ කල යුතුය. එවිට බද්ධ කිරීමේදී (මාස 4 කට පසු) පේලිය 100% බද්ධ කළ හැකි වන අතර, කප්පාදුවෙන් පසු නැවත පේලි සකස් කිරීම අවශ්‍ය නොවේ.

නියං කාලයන්හිදී තවාන වියළීම අවම කර ගැනීම සඳහා අඩි15 x 15 ප්‍රමාණයට ග්ලිරිසීඩියා (වැට මාර) වගා කළ හැක. වර්ෂාව සහිත කාලයන්හිදී ග්ලිරිසීඩියා අතු කප්පාදු කර කාබනික පොහොර සෑදීම සඳහා යොදා ගත හැක. සෙවන ලබාදීම සඳහා අවශ්‍ය වකවානුව සඳහා පමණක් ආවරණ දැල් (50% සෙවන දෙන) භාවිතා කිරීමද කළ හැක.

## ළපටි බද්ධ පැළ තවාන් සඳහා පොහොර යෙදීම

පහත සඳහන් වගුවෙන් සුදුසු පොහොර මිශ්‍රණය තෝරා ගත හැකිය.

වගුව 1. *විවිධ පස් කාණ්ඩ සඳහා වන පොහොර මිශ්‍රණයන්*

| දිස්ත්‍රික්කය/ප්‍රදේශය | පස් කාණ්ඩ | මිශ්‍රණය |
|---|---|---|
| කෑගල්ල/කුරුණෑගල | පාරම්භේ | R/YB 13:17:6:3 |
| මාතලේ | මාතලේ | R/YB 13:16:16 |
| ගාල්ල, කළුතර, රත්නපුර බදුල්ල සහ මොණරාගල | අනෙක් සියළු පස් කාණ්ඩ | R/YB 9:11:11:4 |

පොහොර මිශ්‍රණ වෙළඳ පොළෙන් ලබා ගත හැකි අතර, එසේ නොමැති නම්, පහත වගුවේ දැක්වෙන ආකාරයට මිශ්‍රණය සකස් කර ගත හැකිය.

**වගුව 2.** *විවිධ පොහොර මිශ්‍රණයන් සඳහා සංයුතිය*

| පොහොර මිශ්‍රණය | සල්ෆේට් ඔෆ් ඇමෝනියා (ග්‍රෑම්) | ඩයි ඇමෝනියම් පොස්පේට් (ග්‍රෑම්) | සල්ෆේට් ඔෆ් පොටෑෂ් (ග්‍රෑම්) | එප්සම් සෝල්ට් (ග්‍රෑම්) | මුළු බර (ග්‍රෑම්) |
|---|---|---|---|---|---|
| RYB 13:17:6:3 | 31 | 38 | 13 | 18 | 100 |
| RYB 9:11:11:4 | 23 | 25 | 23 | 29 | 100 |
| RYB 13:16:16 | 32 | 35 | 33 | - | 100 |

## බද්ධ කිරීම දක්වා අවධිය

ප්‍රරෝහණය වූ බීජ පොලිතීන් මල්ල තුල සිටුවීමෙන් සති දෙකකට පසු පොහොර දැමීම ආරම්භ කල යුතුය. මෙහිදී පොහොර මිශ්‍රණයෙන් (වගුව 2) ග්‍රෑම් 112 ක් (අවුන්ස 4) වතුර ලීටර් 4.5 ක (ගැලුමක) දිය කර, පැළයකට මෙම ද්‍රාවණයෙන් මිලි ලීටර් 50 බැගින් සති 2කට වරක් යෙදිය යුතුවේ. ද්‍රාවණයේ ලීටර 4.5 ක් පැළ 90 ක් සඳහා සෑහේ.

## බද්ධ කිරීමෙන් පසු අවධිය

බද්ධ කිරීමෙන් අනතුරුව පොහොර ප්‍රමාණය වැඩි කළ යුතු අතර. මෙහිදී පොහොර මිශ්‍රණයෙන් (වගුව 2) ග්‍රෑම් 168 ක් වතුර ලීටර 4.5 ක දිය කර පැළයකට එම ද්‍රාවණයෙන් මිලි ලීටර් 50ක් බැගින්, සති 2කට වරක් යෙදිය යුතුය.

විශාල තවාන්හි කම්කරු හිගයක් ඇත්නම්, ඉහත දිය කරගත් පොහොර මිශ්‍රණ වලින් එක් පැළයකට මිලි ලීටර් 100 බැගින් සති 4 කට වරක් යෙදීමද කළ හැක.

## පොහොර යෙදීමේදී සිහි තබාගත යුතු වැදගත් කරුණු

පොහොර දැමීම පටන් ගැනීමට ප්‍රථම, සම්පූර්ණ පොහොර ප්‍රමාණයම වතුරේ දිය වී තිබිය යුතුය. පැය කිහිපයක් පොහොර වතුරේ පෙගෙන්නට හැරීමෙන් මෙය පහසු කර ගත හැකි අතර, පොහොර දමන අතරතුරේදී වරින් වර ද්‍රාවණය කැලතීම අත්‍යාවශ්‍ය වේ.

## රෝග මර්ධනය කළ යුතු ද? ඔව්,

පත්‍ර රෝග ලක්ෂණ පහල වීමට කලින්, නිතිපතා දිලීර නාශක යෙදීම වැදගත් වේ. රෝග වලක්වා ගැනීම, රෝග වැළදීමට පසු ප්‍රතිකාර කිරීමට වඩා ප්‍රතිඵලදායකය.

අවම වශයෙන් සති 2 කට වරක් දිලීර නාශක ඉසීම කල යුතු අතර, අයහපත් කාලගුණික තත්ව යටතේ දී සතියකට වරක් දිලීර නාශක ඉසිය යුතුය (වැසි සහිත හෝ අඳුරු කාලගුණික තත්ව යටතේ දී). සාර්ථකව රෝග මර්ධනය කිරීමට නම්, දිලීර නාශක ඉසින යන්ත්‍රයේ පුඩු (නොසල) හොඳ තත්වයේ පැවතිය යුතු අතර, උදෑසනම දිලීර නාශක ඉසීම කළ යුතුය.

- ❖ ඔයිඩියම් පත්‍ර රෝගය සඳහා ගෙන්දගම් කුඩු හෝ තයෝවිට් වැනි ජලයේ දියවන ගෙන්දගම්, සතියකට වරක් (විශේෂයෙන්ම ඔයිඩියම් පත්‍ර පතනය ක්ෂේත්‍ර ශාක වල වසංගත තත්ත්වයෙන් පැතිරී යන පෙබරවාරි/මාර්තු යන කාල වලදී) යෙදිය යුතුය.

- ❖ අනෙක් සුලභව දක්නට ලැබෙන සියලුම රෝග පාලනය සඳහා පහත සදහන් A කාණ්ඩය නියෝජනය කරන දිලීර නාශකයක් සහ B කාණ්ඩය නියෝජනය කරන දිලීර නාශකයක් දින හතක (7) කාල පරතර වලදී මාරුවෙන් මාරුවට යෙදිය යුතුය. කාල පරතරය දීර්ඝ කිරිම හෝ දින හතරක් වැනි කාලයකට කෙටි කිරීම, තවානේ රෝග තීව්‍රතාවය සහ පාරිසරික තත්ත්ව සලකා බලා තීරණය කළ යුතු වේ.

**A කාණ්ඩයට අයත් දිලීර නාශක** - මැන්කොසෙබ්, කාබෙන්ඩසිම්, කැප්ටාන්

**B කාණ්ඩයට අයත් දිලීර නාශක** - බොඩෝ මිශ්‍රණය හෝ තඹ අඩංගු ඕනෑම දිලීර නාශකයක්

(සැලකිය යුතුයි: ඔබ මිලදි ගත් එක් කාණ්ඩයක දිලීර නාශකයක් අවසාන වු පසු එම කාණ්ඩයේ ම වෙනත් දිලීර නාශකයක් මිලදී ගැනීමට සැලකිලිමත් වන්න).

**වගුව 3. තවාන් සඳහා දිලීර නාශක භාවිතය**

| Common name<br>**පොදු නාමය හෝ රසායනික නාමය** | Trade name<br>**වෙළඳ නාමය** | Recommended concentration<br>**නිර්දේශිත සාන්දණ** |
|---|---|---|
| Bordeaux mixture<br>බෝඩෝ මිශ්‍රණය | No commercial preparation available<br>වෙළඳ පොළේ නැත. | සාදා ගත් මිශ්‍රණය එලෙසම යෙදිය යුතුය. (තවාන් සහ අපරිණත වගාවන්හි ශාක වල පත්‍ර වලට ඉසීම සඳහා) |
| Captan<br>කැප්ටාන් | Captan (80%wp) | ග්‍රෑම් 2 හෝ 3 ජලය ලීටර 1ක් (තවාන් සහ අපරිණත වගා වල පත්‍ර වලට ඉසීම සඳහා) |
| Carbendazim<br>කාබැන්ඩසීම් | Bullet 50 (50%wp)<br>Blast all (50%wp)<br>Mackdazim (50%wp)<br>Bavistin (50g/l) | ග්‍රෑම් 2 හෝ මිලි ලීටර 2 ජලය ලීටර 1 ක (තවාන් සහ අපරිණත වගාවන්හි ශාක වල පත්‍ර වලට ඉසීම සඳහා) |
| Copper<br>තඹ | Helmoxy (50%wp)<br>Coblite 50%wp)<br>Cobox (50%wp)<br>COC (50%wp)<br>Punch (50%wp)<br>Copperdoz (50%wp)<br>Anglo COC (50%wp)<br>Copper oxychloride (50%wp) | ග්‍රෑම් 2 හෝ 3 ජලය ලීටර 1 ක (තවාන් සහ අපරිණත වගාවන්හි ශාක පත්‍ර වලට ඉසීම සඳහා) |
| Mancozeb<br>මැන්කොසෙබ් | Dithane M 45 (80%wp)<br>Blitox (80%wp)<br>Mancozeb (80%wp)<br>Unithane (80%wp)<br>Vonozeb (80%wp) | ග්‍රෑම් 2 හෝ 3 ජලය ලීටර 1 ක (තවාන් සහ අපරිණත වගා වල ශාක පත්‍ර වලට ඉසීම සඳහා) |

## බද්ධ අතු සපයා ගැනීම

ඔබටම අයත් බද්ධ අතු තවාන් නොමැති නම් ගුණාත්මක පැළ ලබා ගැනීම සඳහා පැළ තවානක් පවත්වා ගැනීම ඉතා අසීරු කරුණක් බැවින් ඔබ සතුව ප්‍රමාණවත් බද්ධ අතු තවානක් තිබීම අනිවාර්ය වේ. එසේ නොවුවහොත්, තවාන අසාර්ථක වනවා පමණක් නොව, ගුණාත්මක බවින් අඩු පැළ නිෂ්පාදනය ද සිදු වේ.

## බද්ධ අතු වල ගුණාත්මක භාවය

ගුණාත්මක බවින් උසස් බද්ධ පැළ ලබා ගැනීම සඳහා, ග්‍රාහක පැළ වල තත්වය සේම, බද්ධ පොතුවල ගුණාත්මක බවද එකසේ වැදගත් වේ. ගුණාත්මක බවින් උසස් බද්ධ පොතු භාවිතා නොකළ හොත්, ශක්තිමත් ග්‍රාහක පැළ සෑදීම සඳහා ඔබ දරණ ලද ප්‍රයත්නය නිශ්ඵල වනු නිසැකය.

## බද්ධ අතු තවානක් පවත්වා ගැනීම සඳහා සපුරා ගත යුතු අවශ්‍යතා

- තවානේ වයස අවුරුදු 10ට අඩු විය යුතුය.
- බද්ධ අංකුර ලබා ගන්නා අතු වල වයස අවුරුද්ද නොඉක්ම විය යුතුය.
- බද්ධ අතු භාවිතා නොකළද, වාර්ෂිකව තවාන කප්පාදු කළ යුතුය.
- ක්ලෝන මිශ්‍ර නොවන පරිදි වෙන් වෙන්ව පවත්වා ගත යුතුය.

## බද්ධ අතු තවාන

බද්ධ අතු තවානේ පැළ සහ පේලි අතර පරතරය, පාත්තියේ ප්‍රමාණය හා භූමිය අනුව, 4’ x 4’ හෝ 3’ x 6’ ලෙසින් වෙනස් කර ගත හැක. බද්ධ කිරීමට සති 9-10 කට පමණ පෙර, දුඹුරු පැහැ පොත්ත සහිත මේරූ අතු, කොළ මාලයකට ඉහළින් කප්පාදු කොට, අළුත් අතු වැඩෙන්නට සැලැස්වීමෙන්, බද්ධ කිරීම සඳහා වැඩි අංකුර ප්‍රමාණයක් ලබා ගත හැක.

බද්ධ කිරීමට සති 3 කට පමණ පෙර, කොළ මාලයේ පහළින් ඇති පත්‍ර හතරක් හෝ පහක් පමණ නටුවෙහි කොටසක් සමග කපා ඉවත් කිරීමෙන් අනතුරුව, නටුවෙහි ඉතිරි කොටස හැලීයාමෙන් පසු, කක්ෂීය අංකුර ද බද්ධ කිරීම සඳහා යොදා ගත හැක.

බද්ධ අතු තවානේ පැළ කප්පාදු කළ විගස, ඒවාට පොහොර යෙදීම ඉතා වැදගත් වේ. මෙමගින් ලබා ගත හැකි අතු ගණන වැඩි වන අතරම අතු හොඳින් වර්ධනය වීමද සිදු වේ.

| දිස්ත්‍රික්කය/ පළාත | පස් කාණ්ඩය | පොහොර මිශ්‍රණය | වසරකට ගසකට යොදන පොහොර ප්‍රමාණය (ග්‍රෑම්) | |
|---|---|---|---|---|
| | | | පළමු වසර | දෙවන වසර සිට |
| කෑගල්ල/ කුරුණෑගල | පාරම්භේ | R/U/15:15:7<br>කීසරයිට්<br>ඩොලමයිට් | 275<br>50<br>- | 550<br>-<br>75 |
| මාතලේ | මාතලේ | R/U/12:14:14<br>කීසරයිට්<br>ඩොලමයිට් | 275<br>-<br>- | 550<br>-<br>- |
| ගාල්ල, කළුතර, රත්නපුර, බදුල්ල සහ මොණරාගල | අනෙක් සියළු පස් කාණ්ඩ | R/U/12:14:14<br>කීසරයිට්<br>ඩොලමයිට් | 275<br>75<br>- | 550<br>-<br>150 |

## බද්ධ කිරීම

හොඳින් තඩත්තු කරන ලද ග්‍රාහක පැළ මාස 3-4 කාලයකදී බද්ධ කිරීමට හැකි තත්වයට පැමිණේ. බද්ධ කිරීම සඳහා මේ පැළ වල විෂ්කම්භය මිලි මීටර් 6 කට වඩා වැඩි විය යුතුය.

වර්ධන අවධිය, එනම් ග්‍රාහක පැළයේ ඉහළ කොළ මාලය මෝරා ඇත්ද, නැත්ද, යන්න බද්ධයෙහි සාර්ථක භාවය කෙරෙහි බල නොපායි. එබැවින්, නොමේරූ දළු සහිත ග්‍රාහක පැළ ද බද්ධ කිරීම සඳහා යොදා ගත හැක. බද්ධ කිරීමේ ක්‍රමය, හරිත බද්ධ ක්‍රමය ම වේ.

බද්ධය සාර්ථක වූ ග්‍රාහක පැළ බද්ධ කිරීමෙන් සති 4 කට පසු බද්ධ අංකුරයේ සිට 6" උසින් කප්පාදු කර අළුත් අංකුරය වැඩීමට සලස්වනු ලැබේ. මෙහිදී ග්‍රාහක කඳෙන් වැඩෙන අංකුර ඉවත් කළ යුතුය. පැළ කප්පාදු කිරීම සිදුවන කාලය දැඩි නියඟ සහිත කාලයක් නම් කප්පාදු කරන ලද පැළ සඳහා ආවරණයක් යෙදීම වැදගත්ය.

## තවානෙන් කේෂත්‍රයට

මේරූ කොළ මාලයක් හෝ කොළ මාල 2ක් (ඉහළ කොළ මාලය මේරූ) සහිත පැළ කේෂ්ත්‍රයේ ස්ථාපනය කල යුතුය.

පැළ කේෂත්‍රයේ සිටුවීමට දින 10කට පමණ පෙර, පොලිතීන් බෑගයේ පතුලෙන් පිටතට වැඩුනු මුල් කපා පසෙන් වෙන් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. අනතුරුව පැළ ප්‍රවාහණය ඉතා ප්‍රවේශමෙන් කළ යුතු අතර, සිටුවන තුරු පැළ හිරු එළියට කෙලින්ම නිරාවරණය නොවන පරිදි හොඳින් ජලය සම්පාදනය කර තබා ගැනීම ඉතා වැදගත් වේ.


## නිරෝගිමත් පැළයක් කේෂත්‍රයේ ස්ථාපනය කළ විගස මිය යා හැකිද?

**ඔව්,**

මෙසේ වීමට ඉඩ ප්‍රස්ථාව ඇත්තේ,

- සිටුවීමට දින 10 කට පමණ පෙර, මූල පද්ධතිය නියමිත ආකාරයට කපා පසෙන් වෙන් කිරීම සිදු නොකළේ නම් ද,
- ප්‍රවාහනයේදී හෝ පැළ සිටුවීමේදී මූල පද්ධතියට හානි සිදු වුයේ නම් ද,
- කේෂ්ත්‍රයේ සිටුවීමෙන් අනතුරුව, අවශ්‍ය පමණ වර්ෂාව නොලැබී යාම සහ අහිතකර කාලගුණික තත්වයන් ඇති වුයේ නම් ද,
- සිටුවන අවස්ථාවේදී පැළවල ඉහල කොළ මාලය නොමේරූ දළු සහිත වීමත් ද,
- පැළ ඉතා දුර්වල වීම හා පත්‍ර රෝගවලට ගොදුරු වීම ද යන අවස්ථාවන්හිදී ය.

# තත්වයෙන් උසස් බද්ධ රබර් පැළයක් සාදා ගන්නේ කෙසේද?



# ළපටි බද්ධ තවාන් සඳහා කාර්යය සැලැස්ම

| නිම කලයුතු වැඩ විස්තර | *අගෝස්තු තවාන් සඳහා* | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි |
| පොලිතීන් මලු වලට පස් පිරවීම | | | | | | | | | | | | |
| බීජ එකතු කර ගැනීම සහ වැලි පාත්ති වල දැමීම | | | | | | | | | | | | |
| රෝපණය වූ බීජ මලු වල සිටුවීම සහ දුර්වල පැළ මාරු කිරීම | | | | | | | | | | | | |
| පොහොර යෙදීම/ දුර්වල පැළ ඉවත් කිරීම | | | | | | | | | | | | |
| රෝග මර්ධනය | | | | | | | | | | | | |
| බද්ධ අතු තවාන් කප්පාදු කිරිම | | | | | | | | | | | | |
| බද්ධ කිරිම | | | | | | | | | | | | |
| පැළ කප්පාදු කිරීම සහ අංකුර ඉවත් කිරීම | | | | | | | | | | | | |
| කේෂ්ත්‍රයේ සිටුවන තුරු නඩත්තුව | | | | | | | | | | | | |
| කේෂ්ත්‍රයේ සිටුවීම | | | | | | | | | | | | |
| | දෙසැ. | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. |
| | **ජනවාරි තවාන් සඳහා** | | | | | | | | | | | |